MS - 01S

# ඉතිරිකිරීමේ ගිණුම

COMMERCIAL BANK

- ☐ සාමාන්‍ය ඉතුරුම් ගිණුම
- ☐ පවර් සේවින්ග්ස් ගිණුම
- ☐ සුපර් සේවර් ගිණුම
- ☐ අනගි කාන්තා ඉතුරුම් ගිණුම

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි**

දිනය (දිනය/මාසය/වර්ෂය) : __ __ / __ __ / __ __ __ __

ගිණුම් අංකය :

කළමණාකරුගේ කෙටි අත්සන:

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

(ශාඛාවේ නම)

## ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කිරීමේ අයදුම්පත

කරුණාකර මගේ/අපගේ නමට/නම්වලට ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කරන්න. මෙම ගිණුම හැසිරවීමට අදාළ රීති හා රෙගුලාසි වලින් බැඳීමට හා ඒ අනුව කටයුතු කිරීමට මම/අප එකඟ වෙමි/වන්නෙමු. ගිණුම ක්‍රියාකරවනු ලබන්නේ මම/අප/අප දෙදෙනාගේ එක් අයකු විසින්ය.

ඉතිරිකිරීමේ ගිණුම් - පාස්පොත සහිත ☐ ඉතිරිකිරීමේ ගිණුම් - ප්‍රකාශ සහිත ☐ මසකට වරක් ☐ / කාර්තුවකට වරක් ☐ ගිණුම් ප්‍රකාශයක් අවශ්‍ය වේ

(CIF අංකය __________ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. සම්පූර්ණ නම
(වාසගම යටින් ඉරක් අඳින්න)

මහතා/මෙනවිය/මිය/..................

ලිපිනය

උපන් දිනය (දිනය/මාසය/වර්ෂය) __ __ / __ __ / __ __ __ __ ජා.හැ.අ./වි.ග.බ අංකය

දුරකථන අංකය (නිවස) දුරකථන අංකය (ජංගම)

වෘත්තිය (විස්තර කරන්න) විද්‍යුත් තැපෑල

මම ආදායම් බදු ගෙවන්නෙක් නොවෙමි ☐ වෙමි ☐ ආදායම් බදු ලිපිගොනු අංකය

දැනට පවතින ගිණුම් අංකය (තිබේ නම්) අත්සන

### බද්ධ ගිණුමක් නම් - වෙනත් අයදුම්කරු පිළිබඳ විස්තර

(CIF අංකය __________ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

2. සම්පූර්ණ නම
(වාසගම යටින් ඉරක් අඳින්න)

මහතා/මෙනවිය/මිය/..................

ලිපිනය

උපන් දිනය (දිනය/මාසය/වර්ෂය) __ __ / __ __ / __ __ __ __ ජා.හැ.අ./වි.ග.බ අංකය

දුරකථන අංකය (නිවස) දුරකථන අංකය (ජංගම)

වෘත්තිය (විස්තර කරන්න) විද්‍යුත් තැපෑල

මම ආදායම් බදු ගෙවන්නෙක් නොවෙමි ☐ වෙමි ☐ ආදායම් බදු ලිපිගොනු අංකය

දැනට පවතින ගිණුම් අංකය (තිබේ නම්) අත්සන

පාස් පොත ලබා ගතිමි

01. ගනුදෙනුකරුවන්ට පූර්ව දැනුම් දීමකින් තොරව, බැංකුවේ අභිමතය පරිදි තීරණය කරන පොලී අනුපාතයකට අදාලව මාසිකව පොලිය ගිණුමට බැර කරනු ඇත.
02. බැංකුව විසින් පනවන ලද අවම ශේෂය ගිණුමේ නොමැති විට පොලිය බැර කරනු නොලැබේ.

1. ______ අත්සන

2. ______ අත්සන

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි**

KYC ලිපි ලේඛන ලබා ගතිමි

| | කෙටි අත්සන | EMP No. | | කෙටි අත්සන | EMP No. | | කෙටි අත්සන | EMP No. |
|---|---|---|---|---|---|---|---|---|
| යෙදවුම (Input by) | | | පරීක්ෂාව (Checked by) | | | පරිලෝකනය (Scanned by) | | |

# ඉතිරි කිරීමේ ගිණුම පිළිබඳ නීති රීති

- ඉතිරි කිරීමේ ගිණුම පිළිබඳ කටයුතු බැංකුව විසින් සාමාන්‍ය ගණුදෙනු කරන වේලාවන්හිදී සිදුකරනු ලැබේ.
- ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍ය වන අවම තැන්පත් මුදල, ශාඛාව අනුව වෙනස් විය හැකි අතර එම විස්තර අදාල ශාඛා වෙතින් ලබා ගත හැක. පසුව කෙරෙන තැන්පතු සඳහා සීමාවන් නොමැත.
- නියමිත අවම ශේෂය නොමැති ගිණුම් බැංකුව විසින් වසා දැමීමට ඉඩ ඇත.
- කොමර්ෂල් බැංකුවේ නමට නොලියන ලද චෙක්පත් / අණකර සහ මුදල් ඇණවුම් යනාදිය ඉතුරුම් ගිණුම් වලට බැර පිණිස භාර ගනු ලබන්නේ බැංකුවේ අභිමතය පරිදි පමණි.
- දෛනික ශේෂයන් මත පොළිය ගණන් බලා මාසිකව ගිණුමට බැර කරනු ලැබේ.
- සෑම පාස්පොත් ඉතුරුම් ගිණුම් හිමියෙකුටම පාස්පොතක් නිකුත් කරන අතර එය ආරක්ෂා සහිතව තබා ගැනීම ගිණුම් හිමියාගේ වගකීම වන්නේය. පාස්පොත නැති වුවහොත්, සොරා ගතහොත් හෝ අස්ථානගත වුවහොත් ඒ බව බැංකුව වෙත වහාම දැන්විය යුතුය.
- ගිණුමට තැන්පත් කරනු ලබන හා ඉන් ආපසු ගනු ලබන මුදල් ප්‍රමාණයන් බැංකුව විසින් පාස්පොතේ සටහන් කරනු ඇත. ගිණුම් හිමියන් බැංකුවෙන් පිටවීමට ප්‍රථම තම පාස්පොත් පරීක්ෂා කර බලා එහි සටහන් කර ඇති ගණුදෙනු වල නිවැරදිතාවය ගැන සෑහීමකට පත් විය යුතුය. කිසියම් විෂමතාවයක් ඇත්නම් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය.
- ගණුදෙනු සටහන් කරවා ගැනීමට අවම වශයෙන් පාස්පොත මාස හයකට වරක් වත් බැංකුවට ඉදිපත් කළ යුතුය. වසර තුනකට වඩා පැරණි පෙර ගණුදෙනු පිළිබඳ විස්තර පාස්පොතේ සටහන් කිරීමක් නොකරනු ඇත.
- පාස්පොතේ සටහන් නොවුනු ගණුදෙනු සඳහා ගිණුම් ප්‍රකාශණයක්, බැංකුවේ අභිමතය පරිදි, තැපැල් කර යැවීමේ අයිතිය බැංකුව සතුය.
- පාස්පොත සමග නිසිලෙස පුරවන ලද ආපසු ගැනීමේ පෝරමයක් බැංකුවේ මුදල් කවුළුව වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ ATM කඩිපත මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) උපයෝගී කොටගෙන මුදල් ආපසු ලබා ගත හැක.
- පාස්පොත හා නිවැරදිව අත්සන් කරන ලද ආපසු ගැනීමේ පෝරමයක් මත කරන ලද ගෙවීමක් වෙතොත්, එය ගිණුම් හිමියාට පෞද්ගලිකවම කරන ලද ගෙවීමක් ලෙස බැංකුව විසින් සලකනු ලැබේ.
- ප්‍රකාශන ගිණුමකින් මුදල් ලබාගැනීම සඳහා නිසිලෙස පුරවන ලද ආපසු ගැනීමේ පෝරමයක් බැංකුවේ මුදල් කවුළුව වෙත ගිණුම් හිමියා විසින් ඉදිරිපත් කිරීමෙන් හෝ ATM කඩිපත මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) උපයෝගී කොටගෙන මුදල් ආපසු ලබා ගත හැක. ATM කඩිපත සහ/හෝ නිවැරදිව අත්සන් කරන ලද ආපසු ගැනීමේ පෝරමයක් මත කරන ලද ගෙවීමක් වෙතොත්, එය ගිණුම් හිමියාට පෞද්ගලිකවම කරන ලද ගෙවීමක් ලෙස බැංකුව විසින් සලකනු ලැබේ.
- ඕනෑම විටක මෙම නීතිරීති වලට වෙනසක් හෝ එකතුවක් කිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.